**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී තනතුර (කොන්ත්‍රාත් පදනම)

## 1.0 කාර්යය / වගකීම්:

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු සඳහා සහාය වන සියලුම පද්ධතීන්, ජාලයන් සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා තොරතුරු ආරක්ෂණ ක්‍රමෝපායක් හා පාලන රාමුවක්, සංවර්ධනය කිරීම, කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- මහ බැංකුවේ තොරතුරු ආරක්ෂණ ක්‍රමෝපාය සහ ගෝලීය සම්මතයන් සමඟ සමපාත වන පරිදි තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පාලන ශිල්පීය ක්‍රමවේද වැඩි දියුණු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
- තොරතුරු ආරක්ෂණය පිළිබඳ මනා පරිචයන් හා මාර්ගෝපදේශ පිළිපැදීම සහ නීතිමය හා නියාමන අනුකූලතාව සහතික කිරීම.
- බැංකුවේ තොරතුරු ආරක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් වන සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කිරීම සහ තොරතුරු ආරක්ෂණ ක්‍රියාවලිය සම්බන්ධ ව්‍යාපෘති සඳහා නායකත්වය ලබා දීම.
- අනෙකුත් දෙපාර්තමේන්තු සහ පාර්ශ්වකරුවන් සමඟ තොරතුරු ආරක්ෂණ ඉලක්ක සහ නව වැඩසටහන් ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම.
- බැංකුවේ තොරතුරු ආරක්ෂණ ක්‍රියාවලියෙහි සඵලතාවය, පිළියම් ලෙස ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමග කළමනාකාරීත්වයට වාර්තා කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු ආරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ නිසි දැනුම්වත්භාවයක් ලබා දීම තහවුරු කිරීම.
- තොරතුරු ආරක්ෂණය හා සම්බන්ධ සිද්ධි සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය අඛණ්ඩව අධීක්ෂණය හා කළමනාකරණය සහතික කිරීම සහ තොරතුරු ආරක්ෂණ කණ්ඩායමක් පිහිටුවීම.

## 2.0 අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

### 2.1 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්:

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් හෝ විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනය (IEEE) විසින් පිළිගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳව විශේෂ උපාධියක් (අවම වශයෙන් වසර (03) ක)

**සහ**

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් හෝ විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනය (IEEE) විසින් පිළිගත් තොරතුරු ආරක්ෂණය හෝ පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළබඳ පශ්චාත් උපාධියක්

**සහ**

- තොරතුරු ආරක්ෂණය පිළිබඳ පහත දක්වා ඇති ඕනෑම විධිමත් සහතිකයක් ලබා තිබීම.
  තොරතුරු පද්ධති ආරක්ෂණ වෘත්තිකයකු ලෙස (ISC)$^2$ මඟින් පිරිනමනු ලබන සහතිකය (CISSP)
  තොරතුරු ආරක්ෂණ කළමනාකරුවකු ලෙස ISACA මඟින් පිරිනමනු ලබන සහතිකය (CISM)
  තොරතුරු පද්ධති විගණකවරයකු ලෙස ISACA මඟින් පිරිනමනු ලබන සහතිකය (CISA)
  ISACA මඟින් පිරිනමනු ලබන අවදානම් සහ තොරතුරු පද්ධති පාලන සහතිකය (CRISC)
  තොරතුරු ආරක්ෂණ වෘත්තිකයකු ලෙස GIAC මඟින් පිරිනමනු ලබන සහතිකය (GISP)

### 2.2 පළපුරුද්ද:

තොරතුරු ආරක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකාර තනතුරක වසර 05ක පළපුරුද්ද ඇතුළුව තොරතුරු ආරක්ෂණ/තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද.

### 2.3 යෝග්‍යතාවය සඳහා අමතර කුසලතා:

- ආරක්ෂක හා පාලන රාමු සහ ප්‍රමිතීන් පිළිබඳ පළපුරුද්ද සහ දැනුම (නිදසුන්: ISO 27001, NIST, COBIT)
- ඕනෑම පුද්ගලයකුහට තොරතුරු ආරක්ෂණ ක්‍රියාවලියෙහි සංකල්ප සන්නිවේදනය කිරීමේ හැකියාව සහ විශිෂ්ට ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතා
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් සහ මෙහෙයුම් පිළිබඳ අවබෝධය
- තොරතුරු ආරක්ෂණ ක්‍රියාවලි විශ්ලේෂණය කිරීමට, වැඩි දියුණු කිරීමට සහ ඉහළ කළමනාකාරිත්වය වෙත තොරතුරු ආරක්ෂණ ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීමට හැකි වීම
- තොරතුරු ආරක්ෂණ ක්ෂේත්‍රයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර නීති රාමුව පිළිබඳ මනා අවබෝධයක් තිබීම (නිදසුන්: පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත, පරිගණක අපරාධ පනත, ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත ආදිය)
- සැලසුම්කරණය සහ ක්‍රමෝපායික කළමනාකරණ කුසලතා
- දැඩි කාර්යබහුල තත්ත්වයන් යටතේ වුව ද නිසි ලෙස කටයුතු සංවිධානය කරගැනීමට ඇති හැකියාව
- ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතා

**අයදුම්පත සමග අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

## 3.0 වයස:

2023.08.23 දිනට අවුරුදු 50ක් හෝ ඊට අඩු විය යුතුය.

## 4.0 රැකියාව:

කොන්ත්‍රාත් පදනම මත වසර 03 ක් සඳහා බඳවා ගැනේ.

## 5.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ඇතුළුව ක්ෂේත්‍රයේ මේ හා සමාන තනතුරුවලට ගෙවනු ලබන වැටුපට සමගාමී ව ආකර්ෂණීය වැටුපක් ලබා දෙනු ඇත (වැටුප සාකච්ඡා කොට තීරණය කරගත හැකිය).

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින් තෝරා ගැනෙනු ඇත.

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතු අතර, සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.08.23 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේදී “ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත)” යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කරගනු නොලැබේ. තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.

බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සළකා බලනු ලැබේ.

**අධ්‍යක්ෂ – මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථන: 011-2477330 ෆැක්ස්: 011-2477715**